# ඉංග්‍රීසි අධ්‍යාපන සාධනය කෙරෙහි බලපාන සමාජ ආර්ථික සාධක හඳුනා ගැනීම.
## (කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය අධ්‍යාපන කලාපයේ පාසලක් ඇසුරින්)

**ආර්. පී. ඩී. එන්. වයි. ප්‍රේමරත්න**[1]

**සංක්ෂේපය**

වර්තමානය දක්වා කාලය තුළ ඉංග්‍රීසි අධ්‍යාපනයේ වර්ධනය උදෙසා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිහිපයක්ම සිදු වුවද ඉන් ඇති වූ බලපෑම එතරම් තෘප්තිමත් මට්ටමක නැත. ශිෂ්‍යයින්ගේ සමාජ ආර්ථික පසුබිම අධ්‍යයනය කිරීමේදී ඔවුන්ගේ දෙමාපියන්ගේ අධ්‍යාපන මට්ටම, ආදායම් මට්ටම සහ වෘත්තීමය කිර්තිමත්භාවය පදනම් කර ගන්නා ලදී. භාෂාවක් ඉගෙනීමේදී ඒ සඳහා බලපාන සාධක පිළිබඳ පෙර සාහිත්‍යයන් විමර්ශනය කරමින් අධ්‍යයනය සිදු කරන ලදී. ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂා සාක්ෂරතාවය අවම මට්ටමක පැවතීමට සමාජ පසුබිම සහ ආර්ථික මට්ටම සිදු කරනු ලබන බලපෑම අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වෙයි. මෙම අධ්‍යයනය සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය අධ්‍යාපන කලාපයේ නික/වාරි පාදෙනිය ශ්‍රී සුනන්ද මහා විද්‍යාලයේ  සිසුන් 100 දෙනෙකුගෙන් යුත් නියැදියක් සසම්භාවී ලෙස තෝරා ගන්නා ලදී. මෙම අධ්‍යයනය සඳහා ප්‍රශ්නාවලි මගින් දත්ත රැස්කර ගන්නා ලදී. ප්‍රශ්නාවලි මගින් රැස්කර ගන්නා ලද ප්‍රමාණාත්මක දත්ත වගු, ප්‍රස්තාර මගින් ඉදිරිපත් කොට ඇති අතර කයි වර්ග පරීක්ෂා මගින් දත්ත විශ්ලේෂණය සිදු කර ඒ මගින් ශිෂ්‍යන්ගේ සමාජ ආර්ථික පසුබිම ඉංග්‍රීසි විෂය සාධනය කෙරෙහි බලපෑම කරන්නේ දැයි පරීක්ෂා කරන ලදී. මෙම පර්යේෂණයෙන් අනාවරණය වූයේ, ඉහළ අධ්‍යාපන මට්ටමක් සහ ආදායම් මට්ටමක් සහිත දෙමාපියන් තම දරුවන් ඉංග්‍රීසි විෂයට උපකාරක පන්ති වලට යොමු කිරීමෙන්ද නිවසේදී වැඩි කාලයක් ඉංග්‍රීසි අධ්‍යාපන කටයුතු වලට යොමු කිරීමෙන්ද අමතර පොත්පත්, පුවත්පත් ලබාදීමෙන්ද පුස්තකාල පහසුකම් අන්තර්ජාල පහසුකම් සැපයීමෙන්ද ඉංග්‍රීසි විෂය සාධනය කෙරෙහි බලපෑම් සිදු කරන බවයි. ඉංග්‍රීසි විෂය සාධනය අඩු මට්ටමක් සහිත සිසුන්ගේ දෙමාපියන් අඩු අදායම් සහ අඩු අධ්‍යාපන මට්ටමක් සහිත බවත් ඔවුන් ඉහළ වෘත්තීමය තත්වයක පසු නොවන්නන් බවත් අනවරණය විය. ඒ අනුව එම සිසුන්ගේ ඉංග්‍රීසි විෂය සාධනය වැඩි කර ගැනීමට කටයුතු කළ යුතු බව අධ්‍යනයෙන් හෙළි විය. ඒ සඳහා පාසල් ඉංග්‍රීසි ගුරුවරුන් පුහුණු වැඩසටහන් සඳහා නිතර යොමු කරවීම, ඉංග්‍රීසි ගුරුවරුන්ගේ ඉගැන්වීම් කටයුතු ඇගයීමකට ලක්කිරීම විශේෂයෙන්ම ඉංග්‍රීසි කියවීම, ලිවීම, කථනය සහ ශ්‍රවනය සම්බන්ධීකරණය කරමින් ඉගැන්වීමට අදාළ සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය.

**මුඛ්‍ය පද :** සමාජ ආර්ථික පසුබිම, ඉංග්‍රීසි අධ්‍යාපන මට්ටම, අධ්‍යාපන සාධනය

---

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, yashodhani199@gmail.com